# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120 2171635

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1751 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 25/11/2024 පැය 0600

## මාධ්‍ය නිවේදනය

**01. වාලම්පුරියක් විකිණීමට තැත් කළ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය.**

**දුර්ලභ සණයේ ටයිටන් වර්ගයේ** වාලම්පුරියක් රුපියල් කෝටියක මුදලට විකිණීමට තැත් කරන බවට වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකයට ලද පණිවිඩයක් මත 2024.10.24 වන දින උදෑසන කාලයේ තිහගොඩ පොලිස් වසමේ අපරක්ක අධිවේගී පිවිසුම අසලදී වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **වාලම්පුරියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තිහගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26ක් වන හංවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිහගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාරාහේන්පිට පොලිස් ස්ථානය.**

2024.11.24 වන දින උදෑසන කාලයේ නාරාහේන්පිට පොලිස් වසමේ පීරකොටුව ප්‍රදේශයේදී නාරාහේන්පිට පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 850 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 වන නාරාහේන්පිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාරාහේන්පිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුර.**

2024.11.24 වන දින සවස් කාලයේ කල්කුඩා පොලිස් වසමේ පාසිකුඩා ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 19 මිලිග්‍රෑම් 630 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු හා **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කල්කුඩා පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 වයසේ පසුවන තලෙයිමන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කල්කුඩා පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - වනාතවිල්ලුව පොලිස් ස්ථානය.**

2024.11.24 වන දින උදෑසන කාලයේදී වනාතවිල්ලුව පොලිස් වසමේ රාල්මඩුව ප්‍රදේශයේදී වනාතවිල්ලුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් සිව් දෙනෙකු හා සැකකාරියක් කැණීම් උපකරණ හා පූජා භාණ්ඩද සමග** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28,36 හා 53 වයස්වල පසුවන එළුවන්කුලම, කරතිව් ජාඇල හා පාලවිය ප්‍රදේශවල පදිවංකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 55ක් වන එළුවන්කුලම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

වනාතවිල්ලුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. වන සතුන් දඩයම් කර ත්‍රීරෝද රථයකින් රැගෙන යමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මඩාටුගම පොලිස් ස්ථානය.**

2024.11.24 වන දින දහවල් කාලයේ මඩාටුගම පොලිස් වසමේ ඇලගමුව ප්‍රදේශයේදී මඩාටුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හක්කපටස් යොදා මරණ ලද වල් ඌරන් දෙදෙනෙකු හා වෙඩි තබා මරණ ලද හාවෙකු ත්‍රීරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 37 යන වයස්වල පසුවන මඩාටුගම හා නුගගහවත්ත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් අනාවරණය වූ කරුණු මත නව ඇලගමුව ප්‍රදේශයේදී **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි **වයස අවුරුදු 30ක් වන නව ඇලගමුව** ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. මඩාටුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මෘත ශරීරයක් හමුවීම - මාතලේ පොලිස් වසම.**

2024.11.23 වන දින ඕවිලිකන්ද ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු අතුරුදහන්ව ඇති බවට මාතලේ පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර තිබූ අතර මෙම පුද්ගලයාගේ මළ සිරුර 2024.11.24 වන දින ඕවිලිකන්ද ගල්කැටේ ප්‍රදේශයේ වෙල් යායක් අසල ළිඳක තිබී හමුවී ඇත.

**මරණකරු වයස අවුරුදු 40ක් වන ඕවිලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**